# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - නොවැම්බර් මාසය - 2 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

M.A.R.P.කුමාරි - ර/රත්මලවත්ත මහා විද්‍යාලය

## අපි තාත්තාට අම්මාට උදවු කරමු - 20 පාඩම

තෙරුවන් සරණයි දුවේ පුතේ. පුතාලට මතකද සාලිකේදාර ජාතකය සතුන් පවා තමන්ගේ දෙමව්පියන්ට සලකන්න ඇප කැප වී කටයුතු කල ආකාරය අපිට ඒ කතාවෙන් පැහැදිලි වෙනවා. කුඩා කල සිට දරුවෙකු රැක බලාගෙන පෝෂණය කරලා උස් මහත් කරන්නට දෙමව්පියන් වෙහෙසෙන ආකාරය අපි හොදින් හිතට ගනිමු. ඒ නිසා දුවලා පුතාලා ඔයාලගේ අම්මට තාත්තට දෙවියන්ට වගේ සලකන්න. පුරුදු වෙන්න. අම්මගෙ තාත්තගේ වචනයට කීකරු වෙන්න.

දුවලා පුතාලා දන්නවා මාතු පෝෂක ජාතක කතාවේදී තමන්ගේ පුතාට මගේ පුතා බුදු වේවා කියා ආශිර්වාද කලේ අම්මා. අම්මගෙ ආශිර්වාදය ඉතා බලවත් ආශිර්වාදයක් කියලා බෞද්ධ ළමයි වන අපි දැනගන්න ඕනි. අපේ බුදු පියාණන් වහන්සේ බුදු වුනෙත් අම්මගෙ ඒ ආශිර්වාදයෙන් පෙරුම් පුරාගෙන ඇවිල්ලා.

එහෙනම් දුවලා පුතාලා දන්නවා අම්මාට තාත්තාට උදවු කිරීම කොච්චර උතුම් ක්‍රියාවක් ද කියලා .

එහෙනම් දුවලා පුතාලට පුලුවන්

01.අම්මා වෙනුවෙන් කල හැකි උදව් ලියන්න.

02. තාත්තා වෙනුවෙන් කල හැකි උදව් ලියන්න.

ඒ වගේම ඒ උදව් චිත්‍රයට නගන්න.

දිනපතා මවට හෝ පියාට කරන උදව්ව වගන්තියකින් ලියා එය චිත්‍රයට නගා හොදවැඩ පොතක් හදමු.

මේ පාඩමට අයත් වීඩියෝ පාඩම නැරඹීම සදහා youtube එකට ගොස් Renuka kumari අපි තාත්තාට අම්මාට උදවු කරමු ලෙස type කරන්න.

**"හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**